# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015
## Primary Piriven Year End Term Test - 2015
5 වසර /Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

**ඉතිහාසය**
**History**

කාලය : පැය 03 යි.
Time : Three hours.

I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II වන කොටසින් 08 වන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

**I කොටස.**

01) කෙටි පිළිතුරු සපයන්න.

I. අ. මහා වංශයේ මුල් කොටස රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?
ආ. මහා වංශයට ලියන ලද ටීකාව නම් කරන්න.

II. අ. විජය රජුගේ අමාත්‍යවරු විසින් පිහිටවා ගත් ජනාවාස දෙකක් නම් කරන්න.
ආ. ගොණගම පට්ටනය නම් වරාය වර්තමානයේ හඳුන්වන නම ලියන්න.

III. අ. පණ්ඩුකාභය රජු දවස මෙරට තිබූ ඇදහිලි හා විශ්වාස දෙකක් නම් කරන්න.
ආ. මිහිඳු හිමියන් මෙරට දී දේශනා කරන ලද ප්‍රථම සූත්‍ර දේශනාව දක්වන්න.

IV. අ. ලක්දිව ඉදිකළ ප්‍රථම ඓතිහාසික ස්තූපය ද, එය ඉදිකළ රජතුමා ද නම් කරන්න.
ආ. සංඝමිත්තා තෙරණිය මෙරටට ගොඩබට වරාය දක්වන්න.

V. අ. අනුරාධපුර යුගයේ මෙරට පාලන බලය උරුම කර ගත් රාජවංශ නම් කරන්න.
ආ. වළගම්බා රජු දවස ඇති වූ සාගතය කෙසේ හැඳින් වූයේ ද?

VI. අ. චෝලයන් "ජනනාථ පුරම්" නමින් හැඳින් වූ ප්‍රදේශය කුමක් ද?
ආ. පණාකඩුව තඹ සන්නසෙහි තොරතුරු සඳහන් වන්නේ කවර පාලකයකු පිළිබඳව ද?

VII. අ. පොළොන්නරුවේ නීත්‍යානුකූල බලයට පත් කාලිංග වංශික පාලකයා කවුද ?
ආ. දඹදෙණි රාජ්‍ය කාලයෙන් පසුව රාජධානිය මාරු වන්නේ කවර ප්‍රදේශයකට ද?

VIII. අ. මාඝ පරාජයට පත් කරන්නේ කවර පාලකයෙකු විසින් ද?
ආ. යාපනය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන ම මූලාශ්‍රය කුමක් ද?

IX. අ. කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍යයන් දෙකක් දක්වන්න.
ආ. සපුමල් කුමාරයාට පාලන කටයුතු භාරව තිබුණේ කවර ප්‍රදේශයේ ද?

X. අ. සීතාවක රාජධානියට අයත් රජවරු දෙදෙනෙක් නම් කරන්න.
ආ. උඩරට රාජ්‍යයේ ආරම්භක පාලකයා කවුද?

( ලකුණු - 4 x 10 = 40 )

## II කොටස.

02) I. ලංකාවට පැමිණි ආර්ය කණ්ඩායම් හතරක් නම් කරන්න.

II. ආර්යයන් මෙරටට පැමිණ ගංගා නිම්න ආශ්‍රිතව ජනාවාස ගොඩනගා ගත් ආකාරය කෙටියෙන් හඳුන්වන්න.

III. පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය කාලය සම්බන්ධයෙන් වැදගත් සිදුවීම් සාකච්ඡා කරන්න.

(ලකුණු4 +5+6 = 15)

03) I. මිහිඳු හිමියන් සමඟ මෙරටට වැඩම කරන ලද පිරිස නම් කරන්න.

II. බුදු දහම මෙරට තුළ කෙටි කාලයකින් ජනප්‍රිය වීමට හේතු වූ කරුණු කෙටියෙන් සඳහන් කරන්න

III. බුදු දහම මෙරට සංස්කෘතියෙහි ඇති කළ වෙනස්කම් කවරෙක් දැයි විස්තර කරන්න.

(ලකුණු4 +5+6 = 15)

04) I. වසභ රජු වාරි තාක්ෂණය වෙනුවෙන් හඳුන්වා දුන් නව නිර්මාණය දක්වන්න.

ii. වළගම්බා රජු දවස ඇති වූ නිකාය භේදයට හේතු වූ ඓතිහාසික සිදුවීම කෙටියෙන් විස්තර කරන්න.

iii. අනුරාධපුර යුගයේ දී මෙරටට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 4 +5+6 = 15)


05) I. චෝලයන් පොළොන්නරුව රාජධානියක් ලෙස තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න.

II. නිශ්ශංකමල්ල රජුගේ ශාසනික සේවාව පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

III. "රජරට රාජධානිය බිඳ වැටීමට වගකිව යුත්තේ කාලිංග මාඝය" ඉහත ප්‍රකාශය සනාථ කිරීමට කරුණු දක්වන්න.

(ලකුණු 4 +5+6 = 15)

06) I. පහත දක්නට ලැබෙන පින්තූර වලින් කවර නිර්මාණයක් පිළිබිඹු වේදැයි එයට යටින් ඇති තිත් ඉර මත ලියන්න.

............................... ............................... ............................... ...............................

II. දඹදෙණි යුගයේ II පරාක්‍රමබාහු රජුගේ කාර්ය සාඵල්‍ය කෙටියෙන් හඳුන්වන්න.

III. ලංකාවේ රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමට බලපෑ හේතු සහ සංක්‍රමණ වූ පිළිවෙළ සඳහන් කරන්න.

(ලකුණු 4 +5+6 = 15)

07) I. ගම්පල රාජධානියක් ලෙස තෝරා ගැනීමට හේතු වූ කරුණු 3 දක්වන්න.

II. කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස අගයන්න.

III. යුරෝපා ජාතීන් මෙරටට පැමිණීම නිසා ආගමික සමාජය තුළ හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ පරිවර්තනයන් 2 බැගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 4 +5+6 = 15)

08) I. ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි පහත ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i. දඹකොළ පටුන. ii.ගෝකන්න. iii.මාතලේ. iv.සීගිරිය.

v. ගාල්ඹ නදී. vi.කුරුණෑගල. vii.මිස්සක පව්ව.

( ලකුණු 1 x 7 = 7 )

II. ඉහත (I)හි සඳහන් ඒවා අතුරින් දෙකක් පිළිබඳව ඓතිහාසික තොරතුරු කෙටියෙන් දක්වන්න.

( 4 x 2 = 08 )

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/ இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

මූලික පිරිවෙන් අවසාන විභාගය

විභාග අංකය / சுட்டெண் / Index No. ..................................................

